පි : ඇයි ? මාධ්‍ය හරහා මේ විදියට පොදුවේ දැනුවත් කරන එකම මදිද?
ප්‍ර : කලාකරුවෙක් හැටියට, ඔබට තියෙන සමාජ යුතුකම ඉටුකලා කියලා ඔබ සෑහීමකට පත් වෙනවාද?
පි : නැහැ. මම කොහෙත්ම සෑහීමකට පත් වන්නේ නැහැ. නමුත් මෙවැනි වාතාවරණයක් තුළ හෝ මේ තරම්වත්, යම් මෙහෙවරක් කිරීමට හැකි වීම ගැන නම්, මම සතුටු වෙනවා. එහෙම වෙන්නෙත් හොඳ පද රචකයින්, සංගීත වේදීන් ඇසුරේ හිඳිමින් යහපත් නිර්මාණ වලට දායක වෙලා, එය සමාජයට දුන්න නිසාත

ප්‍ර : ඔබ ඔවැනි ප්‍රකාශයක් කළත්, එක් විචාරකයෙක් ඔබේ ,මා ඉතින් යන්න යනවා, ගීතය .හරියට ලොග් සටහනක් වගේ. කියලත් ප්‍රසිද්ධියේ කියලා තිබුණා. පුවත්පත් වලටත් කියලා තිබුණා.
පි : මම ඒක දැක්කා. ඉන් මම කම්පාවට පත් වුණේ නැහැ. කෙනෙකුගේ දැනුම් මට්ටම, ඥාණ ශක්තිය අනුව තමයිත ඔවැනි ප්‍රකාශ කරන්නේ. ඉතින් ඒකට මට කරන්න දෙයක් නැහැ. මතුපිටින් දකින දේට වඩා ගැඹුරු අරුතක්ත ඒ ගීතය තුළ තිබෙනවා.
ප්‍ර : ඒ වුණාට ඔබ එය නිහතමානීව පිළිගත් බවත්, ඔහු කියලා තිබුණා.
පි : ඉතින් පිළිගන්න එපාය. ඕනෑ කෙනෙකුට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් තියෙනවානේ. ඉතින්, ඇයි මම ඒකට විරුද්ධ වෙන්නේ.

ප්‍ර : ක්ෂේත්‍රය තුළ බැබළෙන තරු කාලයෙන් කාලයට නිවී යන බවත් කියනවා. ඔබ කොහොමද? හැමදාම බැබළෙන්නේ,
පි : ඒක තමයි, මහත්මා ගාන්ධිතුමා කිව්වේ ,සතර අතින් එක් හුළඟට කවුලු පියන් හැර තිබුණට ඒවායේ ගසාගෙන යන්න එපා, කියලා. කලාකරුවා තේරුම් ගන්නට ඕනෑ. ඔහුගේ දේශයේ අනන්‍යතාව, සංස්කෘතිය, සභ්‍යත්වය කියන හර පද්ධතීන්. ඒ තුළ තමයි මේ කලාව රැකෙන්නේ. මේ දේ තේරුම් ගත්ත පිරිස කලා ක්ෂේත්‍රය තුළ රැඳී සිටිනවා. එහෙම නැතිව තම අනන්‍යතාව, සංස්කෘතිය, සභ්‍යත්වය අමතක කරලා පිටරැටියන්ගේ හැම දෙයක්ම අනුකරණය කරමින් අපේ රටේ ජනතාවගේ හද ගැස්ම හඳුනා නොගෙන, කලා නිර්මාණ කළාට

ඒවා ජනතාව අතර රැඳෙන්නේ නැහැ. ඒකයි, ඔබ කියන රඳා පැවැත්ම ඒ අයට තහවුරු කරගන්නට බැරි.

ප්‍ර : සමහර මාධ්‍ය ආයතනවල ප්‍රචාරය වන ගීතත්, එක්ක අත යට මුදල් හුවමාරු වෙන බවත් අහන්න ලැබෙනවා?
පි : රසිකයා ප්‍රතික්ෂේප කරන නිසානේත එම ගීත මුදල් හරහා ප්‍රචාරය වෙන්නේ. ඒකෙන් වෙන්නේ සමාජ වැඩදායී ගීත සමාජය අතරට යාම වළක්වන එක. ගීතය කියන්නේ, එක් ජාතියකට ආගමකට වෙන් වුණ දෙයක් නොවෙයි. එය මුලු මිනිස් සංහතියටම අයිති දෙයක්. ඒ අයිතිය පැහැර ගැනීම සමාජ ද්‍රෝහී ක්‍රියාවක්.

ප්‍ර : යම් කාල වකවානුවක ජනප්‍රිය වූ ගීත නව සංගීතයෙන් නැවත එළි දැක්වීමත්, දැන් දකින්නට ලැබෙනවා. ඒ ගැන මොකද කියන්නේ ?

පි : කාලයෙන් කාලයට ඔවැනි රැළි එනවා. නමුත් එහි පැවැත්ම තාවකාලිකයි. තම අනන්‍යතාවට එය හානියක්.
ප්‍ර : ඔබත් ඔබේ ජනප්‍රිය ගීත නව රිද්මයෙන් එළි දැක්වූවා?
පි : මා එය දිගින් දිගටම කළේ නැහැ. එවකට පැවැති ජනප්‍රිය සංගීත කණ්ඩායමක රැල්ලක් එක්ක සමගාමීව මම එවැනි නව රිද්ම කැසට් පටයක් කළා. එය පිරිසක් අතර ජනප්‍රිය වුණා. නමුත් මාගේ අනන්‍යතාව වැළඳගත් උසස් රස වින්දනයක් ඇති බොහෝ රසිකයින් එය ප්‍රතික්ෂේප කළා. මා එය කළේ යම් පර්යේෂණයක් හැටියටයි. එය අනන්‍යතාවට හානියක් නිසා අසාර්ථක වෑයමක් හැටියටයිත මා දැක්කේ. ඒ නිසා, මා ඉන් බැහැර වුණා. තවත් දවසක එවැනි යමක් මම කරන්නේ නැහැ.

ප්‍ර : ඔබේ ඉදිරි බලාපොරොත්තු මොනවාද?
පි : බොහෝ වෙහෙස මහන්සියෙන් කළ නව නිර්මාණ ඇතුළත් මගේ එකොලොස්වන ගීත එකතුවත් කළා. "අලුත් වැස්සක්" නමින්, එය දැන් එළිදක්වලයි තියෙන්නේ. මාධ්‍යයත්, මෙය ජනතාවට අහන්න සලස්වයි, කියන බලාපොරොත්තුව මගේ තියෙනවා. ඒ එක්කම මියෙන තුරුම යහපත් නිර්මාණ කරමින් කාටත් කරදර නොකර කලා ක්ෂේත්‍රයේම රැඳෙන්න තමයි බලාපොරොත්තුව.

සාකච්ඡා කළේ - පණ්ඩුක සමරසේකර

විමලරත්න කුමාරගම

නැවත කියැවීම 5

රත්න ශ්‍රී විජේසිංහ

විමලරත්න කුමාරගම (1919 - 1962) සිය හතළිස් හතර හැවිරිදි ජීවිතයෙන් වසර විසි හතරක්ම කවිය සමඟ අවියෝජනීයව බැඳෙමින් දිවි ගෙවූවෙකි. 1935 වසරේදී සිය සොහොයුරියගේ වියෝව නිසා හටගත් සංවේදනා 'සංවේග වේදනා' නමින් කවි පොතකට ගොනු කරමින් තම මුල්ම කවි ලිවීම ඇරඹූ හෙතෙම, හතළිස් හතර වන විය සපුරන්ට දින දහ අටක් තිබියදී, 1962 දෙසැම්බර් 30 දා මහනුවර රෝහලේදී සමුගෙන යන්නට දින කීපයකට පෙරද කවි ලියුවේය. දිනපොතේ ලියූ කවි අතර ඔහුගේ අවසන් කවිය හමුවන්නේ දෙසැම්බර් 17 දා ය.

වන්නියේ නියඟ මෙන් නොව, රත්නපුරේ කුකුළු කෝරළයේ ජනතාව පෙළන්නේ වැස්සයි. සොබා දහම.... දරිද්‍රතාවයේ එකම විත්තිකරුවා නොවන වග කවිය ඉතා පහසුවෙන් ම වටහා ගනී. 'රතුකැට' ඊට නිදසුනකි. 'මට බෑ කන්ට රතුකැට වෙන අය වාගේ' යි ඔහු කියයි.
'මම මිණි බිමට ආවෙමි තණ පඳුරු සිඟා' යනුවෙන්ද කියයි. මෙහිදී දරිද්‍රතාව කවියා අවට වෙනත් වේශයකින් පෙනී සිටී.

වහලට සෙවන මානා බේරු බටකොළ
වැරණිය කෝටු නිරුවත් මිතුය වටකළ
ගෙබිමයි ඇඳයි මහ වැහි පොකුරු වටවළ
නුදුටිමි මෙවැනි තතු මා හිටිය රටවල
(රතුකැට)

වැසසේ තෙමෙමින් දළු නෙළන අය පිළිබඳවද කවියාගේ සිතිවිලි යොමුවේ.

අද ඒ තරම් මහ වැහි මෙහි නැතු වාට
පන්නල් ඔයේ දිය තවමත් බොර පාට
වැස්සේ දළු නෙළන අයහට දෙවි පීට
වැස්සට කමත් නෑ නිදියෙන විට රැට
(දිනපොතේ ලියූ කවි - 62.05.23)

තවත් අවස්ථාවකදී කවියා දකින්නේ එක්තරා හෝටලයක් අසල, පඳුරක් අස්සේ හිඳ වැස්සෙන් නංගීට රැකවරණ දෙන අට හැවිරිදි අයියා කෙනෙකි.

පින්සර හෝටලය ළඟ පඳුරක් අස්සේ
නංගී තුරුලු කර සුවදෙන පොද වැස්සේ
අයියකු අට වියැති දූක හදවත ගැස්සේ
මගෙ අත් වලින් දෙදෙනගෙ කඳුලැලි පිස්සේ
(දින පොතේ ලියූ කවි - 62.07.25)

මේ දිගු ගමණින් පසු ලද අත්දැකීම් සම්භාරයෙන් පොහොසත්ව, සංවේදී පරිනත කවියකු ලෙස කුමාරගම කලාපීය අන්‍යතාවෙන් මිදුනු සර්වව්‍යාපී මනුෂ්‍යත්වයට ළංවෙයි. ඊට සතුරු වන පළිබෝධ මෙන්ම එය නගා සිටුවන සාධුකාර අංග ද ඔහුට මුණ ගැසේ. දරු දෙදෙනකුද සමග අසරණව මාවතේ ඇවිද යන කාන්තාවක දකින කවියා, ධනේශ්වර සමාජයක ස්ත්‍රීත්වය පාරිභෝගික භාණ්ඩයක් වන අයුරු නිරූපණය කරයි.

නැලවුනු කුසුම දළු වටයක පපුව මැද
බිම දැමුවෙත්වා කුනු මේ වට තැන ම හිඳ
පුදසුන මතේ සිට අතුගා දමන ලද
මල යා යුතුය විසුමට කුණු ගොඩක වැද
(අසරණ ගැහැනිය)

මාවතේ කුසගිනිව ඉන්න සිඟන දැරියක හා ඒ අසලින් 'පරස් චරස්' හඬ නඟමින් ඇවිද යන රාළහාමි කෙනකු දකින කවියා අඳින චිත්‍රයද සෝපාහාසයෙන් යුක්තය.
ඔවුන් ආරක්ෂා කරන්නේ කුසගින්න සහ දිළිඳු කම බවද මේ කවෙන් කදිමට ගම්‍ය වේ.

කුඩා කෙල්ල මහ පාරේ
බඩගින්නේ ළතැවෙනවා
ඇගේ අතේ පොල් කටුකි
මළකඩ කෑ ටින් කබලකි

රෑ මුරයට ඉන්න අපේ
රාළහාමි ඇවිදිනවා
ජරස් බරස්,
ජරස් බරස් -
(ජරස් බරස්)

දිළිඳුකමට හා අගහිඟකමට මුළුමනින්ම සුන්බුන් කළ නොහෙනා මනුෂ්‍යත්වයේ සාධනීය අංග ඇගැයුම්ශීලී ස්වරයෙන් පළකෙරෙන තවත් රචනා දෙකකි, 'සදා' සහ 'දෙවියන් දුටිමි'. පීතෘත්වය පිළිගන්නට මැලිවන දුප්පත් පියකු අධිකරණයේදී දරු සෙනෙහසට අවනත වන අයුරු 'සදා' ගෙන් කියැවේ. කතරගම පුදබිමේදී තෙමැසි දරුවකු දරා සිටින දිළිඳු බවක් 'දෙවියන් දුටිමි' රචනයේදී හමුවේ. කාලීන දේශපාලන ප්‍රවණතා පිළිබඳව විමලරත්න කුමාරගම කවියා එතරම් සංවේදී වූ බවට කරනු නොවේ.

බණ්ඩාරනායක ඝාතනය සිදු වූ දා ම ඔහු එතුමන් ගැන කවි පෙළක් ලියූ බව ඇත්තය. එහෙත් එය හුදු පුද්ගල සංවේදනාවන්ගෙන් ගැඹුරට යන්නක් නොවන. භාවිතිශය ගුණෙන් පිරි රචනයකි. බණ්ඩාරනායක ඝාතනය සිදුකළ සෝමාරා (පීටර්) එල්ලා, මැරූ දා ද හෙතෙම දිනපොතේ කවියක් ලියයි. (62.07.07). 1962 වසරේ ජූලි මාසය තුළ ඝාතන සංඛ්‍යාව 65 ක් ද, එම වසරේ ගතවූ සත් මස තුළ 370 ක් ද වූ බව කියන කවියා 65.08.01 දා දිනපොතේ කවියක ඒ කවි සටහන් කරමින්, 'මරුවන් සිටින දම්දීපෙට ලොවම වඳී' යනුවෙන් තියුණු උපහාසයක් එල්ල කරයි. කාලීන දේශපාලනය ගැන මෙන්ම 'මැතිසබය' ගැනද කවියා තුළ වූයේ අප්‍රසාදයකි. ඒ බැව් ඍජුවම පළකෙරෙන්නේ, 62.06.21 දා දින පොතේ ලියූ කවියෙනි.

මගෙ රැවුල වණනෙමි
(රාජ රත්තගෙ වාගෙයි)
මැතිසබසුනක් මට
ලැබුණු දා ගෙල කපාගන්නෙමි

සමකාලීන කවීන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන ගිය කුමාරගම, ඇතැම් කලාකරුවන්ගේ 'අංග රචනා' දෙස බැලුවේ උපහාසයෙනි. 62.01.25 දා දින පොතේ ලියූ කවිය ඒ සිතිවිලි හෙළි කරන්නකි.

හිසකේ කපා ගත්තේ දෙමසකට යට
සරුවී වැඩී ඇත ගෙලපිට දෙකන වට
බිය ඇත ලොව කලාකරුවෙකි කියති මට
කොණ්ඩය කපා ගන්නට යා යුතුය හෙට

1962 වසරේ ජූලි මාසය තුළ ඝාතන සංඛ්‍යාව 65 ක් ද, එම වසරේ ගතවූ සත් මස තුළ 370 ක් ද වූ බව කියන කවියා 65.08.01 දා දිනපොතේ කවියක ඒ කවි සටහන් කරමින්, **"මරුවන් සිටින දම්දීපෙට ලොවම වඳිය"** යනුවෙන් තියුණු උපහාසයක් එල්ල කරයි.

ඔහු දින පොතේ ලියූ කවි අතර, කේයස්, අල්විස් පෙරේරා, කුඩලිගම, උඳුගොඩ, නවරත්න, මාකඳුරේ ගුණවර්ධන සහ විල්සන් හෑගොඩ ආදී මිතුරු කිවිවරුන් ගැන ලියූ සටහන් වේ. ඔවුන් අතර නිතර මුණගැසීම්ද, ලිපි හුවමාරුද සිදුවී තිබේ. කේයස් ගේ මළගමෙහි පළමු වසර සැමරුම දා කුමාරගම සිය දින පොතේ මෙසේ සටහන් කරයි.

නව සිය තිස් හතේ මුල්වරට හමුවුණේ
ඇයි ඔබ මැරෙනවා සිහිනෙනුදු නොපෙනුණේ
එදවස අද අතර මොන මලද නොපිපුනේ
එක නටුවෙකම ඇයි අප දෙදෙන නොපිපුනේ.
(62.06.22)

එනම් හෘදයාංගම සැමරුමක් නොවේද?
පී. බී. අල්විස් පෙරේරාගේ 'සුවඳ විලවුන්' කෘතිය ලද දින ඔහු දින පොතේ සටහන් කරන්නේ මෙවැන්නකි.
විවේචකයකු වන්ට පුළුවන් හොඳම කිවියකු වූ පසුයි
උසස් කවියට විවේචනයක් බලෙන් ඔහු පා මැදිරසුයි
විවේචන මත උසස් කිවිදගෙ දෙපාදිලිවලටදහසුයි
කවුරු මොනවා කීවත් කවියට ලෝකයත් නිවනත් මුසුයි

එමෙන්ම 'හිතවකුට' නමින් කුමාරගම ලියා ඇති කවි පෙළ ද ලියා ඇත්තේ අල්විස් පෙරේරා කවියාටම බව පැහැදිළිය.

මෙතෙක් ඔබ ලියූ කවි අනන්තයි බල බලා දුක් විඳින පැල්පත්
දුකින් මිරිකී ඔවුන් ගැන සිතුවෙහිය අමතක නොකර නිල්පත්
ළඟදි බිහි වූ 'අනුර සිහිනය' වටී තරමට පැරනි ගල්පත්
'අපේ උල්පත්' සුවඳ කවමින් මෝරවනු මැන අපේ උල්පත්